# හඬ හැසිරවීම

යම්කිසි නලුවකු හො නිලියක කිසියම් භූමිකාවක් නිරූපනය කිරීමේදී තම මුවින් පිටවන දෙබස් එම මොහොතේ නිරායාසයෙන් තමන්ගෙන් පිටවන දෙබස් ලෙස උච්ඡාරණය කළ යුතුය. දක්ෂ නලුවෙකුට හො නිළියකට නාට්‍යයේ ඇති සංවාද තමන්ගේ හදවතින් ගලා එන ඒවා සේ නිරතුරුවම තමන්ගේ හඬ උස් පහත් කරමින් වැඩි අවධානයක් යොමු කළ යුතු ස්ථාන වලට නිසි බර දෙමින් සංවාද හැසිරවිය යුතු ය.

තමාගේ නිරූපනය අනුව එහි ඇති රිද්මයට ගැලපෙන අයුරින් නල්වා හෝ නිළිය එම මොහොතේ පිට වන සැබෑ අදහස් හා ආකල්ප සිතුවිලි සමුදායක් සේ චතුර ලෙස වාචික අභිනය හැසිරවිය යුතු ය. එමෙන්ම සමහර අවස්ථා වලදී අපට පෙනෙන දෙයක් නම් දුර්වල රංගන හැකියාවක් ඇති නලු නිළියන් දෙබස් කට පාඩම් කරගෙන එම දෙබස් වල ඇති අර්ථය හෝ හැඟීම් තේරුම් නොගෙන තමන්ට සැමදා පුරුදු රිද්මයකට සංවාද කියන ආකාරයයි. එහිදී ඔවුන් හඬ උස් පහත් කරනුයේ චරිතයේ ස්වභාවය අනුව නොව නළුවාට පුරුදු ශෛලියටය. එවිට එය නරඹන ප්‍රේක්ෂකයාට ආංගික අභිනය හා වාචික අභිනය දෙපැත්තකට ගමන් කරන බව මනාව පෙනේ. ඒ අයුරින් රඟපාන නලු නිළියන් නිසා නාට්‍යයේ ඇති චරිත අමු අමුවේ විනාශ වෙයි. ඔබ මෑතකදී නැරඹූ නාට්‍යයක් ඇත්නම් මෙවැනි සිදුවීම් සිදුවූ ආකාරය මෙනෙහි කර බලන්න. එවිට මේ කියූ කරුණ ගැන ඔබට ඇති තරම් නිදර්ශණ සොයා ගත හැකි වනු ඇත. සෑම නලුවකු හෝ නිළියකම නාට්‍ය පෙළෙහි එනම් පිටපතෙහි ඇති සුවිශේෂ කාව්‍යමය ගුණාංග හා භාෂා ප්‍රයෝග අවබෝධ කරගැනීමේ හැකියාව මනාවට තිබිය යුතුය. ඔවුන් සාහිත්‍ය පොත පත කියවා හොඳ නාට්‍ය හෝ හොඳ චිත්‍රපට නරඹා රසඥතාවය වර්ධනය කරගත් ඇසූ පිරූ තැන් ඇති අය විය යුතු ය.

මා අදහස් කරන ලෙස වේදිකාව යනු නලු නිළියන් පුහුණු කරන මනා ශික්ෂණයක් ලබා දෙන පාසලයි. නමුත් මෑතක සිට මේ තත්වය අපෙන් වෙනස් වෙමින් පවතින බව පෙනී යයි. රූපවාහිනිය ජනප්‍රිය වීමත් සමගම රූපවාහිනී ටෙලිනාට්‍යයෙන් රූපවාහිනී චිත්‍රපට එක් රැයක් තුළ විශාල ප්‍රේක්ෂක සංඛ්‍යාවක් නරඹන බැවින් යම්කිසි නලුවකුට හෝ නිළියකට එක් රැයකින් ජනප්‍රිය වීමේ හැකියාව ඇත . එබැවින් ජනප්‍රිය වීමේ ආසාව ඇති පුද්ගලයන් එක් රැයකින් නලුනිලියන් වීමට වෙර දරනු අපට පෙනෙයි. වේදිකාව අමතක කර රූපවාහිනී නලු නිළියන් වීමට රූපවාහිනී මාධ්‍යය තුළට විශාල ලෙස ඇදී යාමේ ප්‍රවණතාවක් පවතියි. නමුත් ඔවුනගේ ඉදිරි ගමන පිළිබඳව අපට ඇත්තේ සැකයකි.

නමුත් රූපවාහිණි හෝ චිත්‍රපට කලාව තුළ යමක් කරන නලුනිලියන් අතලොස්ස වේදිකාවෙන් ආ නලු නිළියන් බව අප අමතක කළ යුතු ය. .



## හඬ උච්ඡාරණය



ශ්‍රීනාත් මද්දුමගේ

වචන උච්ඡාරණයේදී ස්වර බේධයන් හරි හැටි වටහා නොගෙන කතා කරන නලුවාට නාට්‍ය පෙළෙහි ඇති අර්ථකථන එහෙම පිටින්ම විනාශ කළ හැකි ය. එක වචනයක් හෝ නිසි වැටහීමක් නොමැතිව අන්වරිත සමඟ ඇති අන්තර් සම්බන්ධතාව කුමක් දැයි හරි හැටි වටහා නොගෙන කට පාඩම් කරගත් පෙළ හෝ මතක් කර දෙන්නා :චරදපඑැර* කියන දෙබස් ඒ කියන ආකාරයට උච්ඡාරණය කිරීමෙන් නාට්‍යයට වන හානිය අති විශාල ය. ගහන්න යන වචනය කෙනෙකුට අර්ථ රැසක් මතු වන සේ උච්ඡාරණය කළ හිකි ය. එයට පොළඹවන හැටියට උච්ඡාරණය කළ හැකි සේම ප්‍රශ්නාර්ථයක් වන සේ ද උච්ඡාරණක කළ හිකි ය. උදාහරණයක් ලෙස කෙනෙකුට ප්‍රශ්නාර්ථයක් සේ ඇසිය හැකි ය.

''ගහන්න?''
''ගහන්න. ගහන්න''
''අනේ ගහන්න''
''මට කියන්නෙ ගහන්න කියලද?''

මේ ආකාරයට යම් යම් වචන දමා අභ්‍යාස කර බලන්න. එක වචනයක් අර්ථ කීපයක් වන සේ උච්ඡාරණය කළ හැකි ද යන්න ඔබට මනාව වැටහෙනු ඇත.

නාට්‍යයකට සම්බන්ධ වන නලුවාට හෝ නිලියට තමන්ගේ හඬ පාලනය හා හඬ හැසිරවීම ඉතා වැදගත් ය. ප්‍රේක්ෂකාගාරයේ පසු පෙළේ සිටින ප්‍රේක්ෂකයෙකුට පවා මනාව ඇසෙ සේ කතා කිරීමේ හැකියාව අනිවාර්ය වේ. රුපියල් 200 ප්‍රවේශ පත්‍රයක් ගෙන පැමිනෙණ ප්‍රේක්ෂකයාට මෙන්ම පසු පෙලේ සිටින රුපියල් 20 ප්‍රවේශ පත්‍රයක් මිලට ගෙන පැමිනන ප්‍රේක්ෂකයාටද ඇසෙ සේ හඬ පාලනය කළ යුතුය. එමෙන්ම ලංකාවේ බොහෝ වේදිකා වලට අවටින්ඇසෙන ශබ්ද ද ප්‍රේක්ෂකාගාරයට ඇසෙයි. ඒවා ද පරයා හඬ හැසිරවිය යුතුයි.

හඬ මෙසේ පතුරවාලීමේ හැකියාව ඇති වන්නේ නිකම් ම නොව. ස්වර අභ්‍යාස :ඩදසජැ ඔර්සබසබට* කිරීමෙනි. ඒ සඳහා ක්‍රමවත් අභ්‍යාස මාලාවක් ඇත . සැමදා පුරුදු පුහුණු වෙමින් ඒවා වර්ධනය කර ගත යුතුය. අප ද සාමාන්‍ය ජීවිතයේ කතා කරන විට ද යන්තම් තොල් සෙලවීමෙන් කටින් වචන පිට කරන නමුදු නලුවා හොඳ හුස්මක් ගෙන මුලු රංග ශාලාවටම ඇසෙන සේ පපු ප්‍රදේශයෙන් ඇදී එන සේ ශබ්ද පිට කළ යුතු ය. මෙයටද මා කලින් කියූ සේ හුස්ම ගැනීමේ අභ්‍යාස :ඊරුඑයසබට ඍැරසීි* ද කළ යුතු ය. යම්කිසි විශාල දෙබස් ඛණ්ඩයක් ඔබ කියනවා නම් ඔබේ හුස්ම රඳවා තබා ගැනීමේ හැකියාව මත එය සාර්ථක වීම හෝ නොවීම රඳා පවතියි.

උදාහැණයක් ලෙස මේ දෙබස් ඛාණ්ඩය බලන්න. මෙය එක හුස්මට කිව යුතු දෙබස් ඛාණ්ඩයකි.

අධිකාරි (කෝපයෙන් පුපුරමින්)

තමුසෙ දන්නවද මට අහු වෙලා හිටියෙ කව්ද කියලා? අර පාහරයා බෲනෝ. ඔලිවෙට්ටි පැහැරගෙන ගිය එකා. උගෙන් වචනයක් පිටවෙන් ඔන්න මෙන්න කියලා තිබුණා විතරයි තමුසෙගෙ අර ඔල මොට්ටල බකල හෙංචයියා අඩි හප්ප හප්පා ඇවිත් වැඩේ සම්පූර්ණයෙන් ම කෑවා. ඊට පස්සෙ මට හම්බ වුණා අර දුප්පත් නාකි බර්ටසෝ ව. හුළං පුරෝපු බැල්මක් වගේ මූණකුත් එක්ක බෙහෙත් දාන්න අරන් යනවා. තමුසෙලු ඒක කරලා තියෙන්නෙ. මොකකින්ද මිහිට තමුසෙ ගැහැව්වෙ.? තඩි පරාලෙකින්ද? මරු වෙලාව තමුසෙලාම කෙළගන්න. ඇස් කීයක් අපි දිහා බලා ඉන්නවද කියලා තමුසෙලාට තේරෙන්නෙ නැහැ. පත්තර දඩ බල්ලො අපේ කකුල් වටේ කරකරවෙනවා. අපේ උගුරු දණ්ඩට පනින්න. අපේ ඔලු හොඳින් තියා ගන්න ඕනේ අයිසේ.

(වරෙන්තු නාට්‍යයේ පොලිස් අදිකාරි වරයා එක හුස්මට කියන දෙබසකි)

චිත්‍රපටයක හෝ ටෙලි නාට්‍යයක දී මෙම ප්‍රශ්නය පැන නොනගී. මන්දයත් තාක්ෂණය විසින් ඉතා සංවේදී මෙක්‍රෆෝන මාර්ගයෙන් හඬ පටිගත කරගන්නා බැවිනි. වේදිකාවේ දී හඬ ප්‍රක්ෂෙපනය අති.න් අසාර්ථක නලු නිළියන් චිත්‍රපට හා රූපවාහිනී වෘත්තාන්ත වල කැපී පෙනෙන චරිත නිරූපනය කරන රහස මෙයයි.

සෑම ජනප්‍රිය චිත්‍රපට හා ටෙලිනාට්‍ය නලුවෙකුටම වේදිකා නාට්‍ය වල රඟපෑමට නොහැකිය. එහෙත් දක්ෂ වේදිකා නලුවෙකුට හෝ නිලියකට මෙම මාධ්‍ය තුනේම දක්ෂ කම් පෙන්විය හැකි ය. ලංකාවේ හා වෙනත් රටවල දක්ෂ නලු නිලියන් දෙස බලන කල අපට පෙනෙන්නේ ඔවුන් මුල් අඩිතාම දමාගෙන ඇත්තේ වේදිකාවෙන් බවයි. වේදිකාවෙන් බිහිවන නලුවා චිත්‍රපට හා ටෙලිනාට්‍ය වල කැපී පෙනෙනේනේ වේදිකාවෙන් ලත් පන්නරය නිසයි. වේදිකාව අපේ තෝතැන්නයි.

සන්නස පුවත් පත ආරම්භයේ සිටම මම අවුරුදු දෙකක පමණ කාලයක් මා දන්නා දේ හා උගත් දේ පත පොතින් ලත් දේ ඔබට හා බෙදාගන්නට උත්සාහ කළෙමි. මෙතෙක් මා වේදිකාව පිලිබඳව ලියූ මෙම ලිපි පෙළ අදින් අවසන් කරමි. මේ ලියූ සියලුම ලිපි හා තවත් අලුත් දේ එක් කරමින් ''පොළොවෙන් ඉහළට අඩි තුන හතරක්'' නමින් පොතක් එළි දැක්වීමට බලාපොරෝත්තු වෙමි.



ඔබගේ සියලු බදු සහ
ගිණුම් කටයුතු සඳහා
JOEY S. SANTOS & ASSOCIATES
Public Accountants / Registered Tax Agent
ABN: 44 114 687 053
Refunds within 14 days
Services
# Individual/BusinessTax Returns(ELS)
# Accounting/Bookkeeping
# Preparation of Business Activity Statements (BAS)
# Audit of Non-For-Profit Organization and Self-Managed Superannuation Funds
# Personal Service and Advice
ශ්‍රී ලාංකික ඔබට සුහද සේවය
L. A. Dayananda Wimalasiri
B.Com, M.Com, MBus, Adv.Dip. Accounting, PNA
Accountant
Office
63B, Springs Road,
Clayton South, VIC 3169
TP: 9558 6803-4
Fax: 9540 0691
After Hours
7 Whitton Court
Rowville, VIC 3178
TP/Fax: 9755 7400
Mobile: 0402 846 676
E-mail: dayananda@iprimus.com.au
NIA NATIONAL INSTITUTE OF ACCOUNTANTS
PNA